1. $298\ K$ දී $NH_4HS$ ඝනය ඇති කරන පහත සමතුලිතතාවය සලකන්න.

$$NH_4HS_{(s)} \rightleftharpoons NH_{3(g)} + H_2S_{(g)}$$

$298\ K$ දී $4.157\ dm^3$ දෘඪ බඳුනකට $NH_4HS$ සාම්පලයක් දමා ඉහත සමතුලිතයට එලැඹුනු පසු සමතුලිත මුළු පීඩනය $6.6 \times 10^4\ Pa$ වේ. $NH_4HS_{(s)}$ හී පරිමාව නොසලකා හරින්න. පහත ඒවා ගණනය කරන්න.

a. $298\ K$ දී ඉහත සමතුලිතය සඳහා $K_p$

b. ඉහත සමතුලිතතාවයට $298\ K$ දීම $H_2S, x\ mol$ එකතු කල විට සෑදෙන නව සමතුලිතයේ $H_2S$ හී ආංශික පීඩනය $NH_3$ හී ආංශික පීඩනය මෙන් **තෙගුණයක්** වේ.

i. $x$ හී අගය සොයන්න

ii. නව සමතුලිතතාවයේදී $NH_3$ වල මවුල භාගය හා $H_2S$ හී ආංශික පීඩනය සොයන්න.

c. තවත් පරීක්ෂණයකදී $298\ K$ දී පරිමාව $1\ dm^3$ වන දෘඪ බඳුනකට $NH_{3(g)}$ හා $H_2S_{(g)}$ දමා ඉහත සමතුලිතයට එලැඹුනු පසු සෑදී ඇති $NH_4HS$ ප්‍රමාණය ගණනය කරන්න. $NH_3$ හා $H_2S$ හී ආරම්භක ආංශික පීඩන $7.5 \times 10^4\ Pa$ බැගින් වේ.

2. $A$ හා $B$ සම්පූර්ණයෙන් මිශ්‍ර වන ද්‍රව දෙකකි. $298\ K$ දී $A$ හා $B$ හී සංතෘප්ත වාෂ්ප පීඩන පිළිවෙලින් $4 \times 10^4\ Pa$ හා $1.2 \times 10^4\ Pa$ වේ. වාෂ්ප කලාපයේ $A$ හී මවුල භාගය 0.4 නම් $298\ K$ දී

a. ද්‍රව කලාපයේ $B$ හී මවුල භාගය සොයන්න.

b. වාෂ්ප කලාපයේ මුළු පීඩනය සොයන්න.

3. ජලීය ද්‍රාවණ $1\ dm^3$ තුල $C_2H_5COOH, 0.01\ mol$ ක් තිබේ.

a. මෙම ද්‍රාවණයේ $p^H$ අගය ගණනය කරන්න.

b. ජලීය ද්‍රාවණ $0.5\ dm^3$ තුල $C_2H_5COOH, 0.01\ mol$ ක් තිබෙන වෙනත් ද්‍රාවණයක් සලකන්න. $p^H$ අගය 4.75 ක් වු ස්වාරක්ෂක ද්‍රාවණයක් ලබා ගැනිමට එක් කල යුතු $C_2H_5COONa$ මවුල ප්‍රමාණය සොයන්න.

c. ඉහත ස්වාරක්ෂක ද්‍රාවනයට $HCl$ $0.01\ mol$ එක් කල විට ද්‍රාවණයේ $p^H$ අගය කවරේද?

d. ඉහත ස්වාරක්ෂක ද්‍රාවනයට $0.2\ mol\ dm^{-3}\ NaOH,\ 10\ cm^3$ ක් එක් කල විට ද්‍රාවණයේ $p^H$ අගය කවරේද?

e. අදාළ උෂ්ණත්වයේ දී $C_2H_5COOH$ අම්ලයේ $K_a = 1.33\ \times 10^{-5}\ mol\ dm^{-3}$ වේ.

4. ජලීය ද්‍රවණයක $As_2S_{3(s)}$ හී ද්‍රාව්‍යතාවය $s$ හා ද්‍රාව්‍යතා ගුණිතය $K_{sp}$ අතර සම්බන්ධතාවය ලබා ගන්න.
$NaCl$ වලට සාපේක්ෂ සාන්ද්‍රණය $0.1\ mol\ dm^{-3}$ වු ද, $K_2CrO_4$ වලට සාපේක්ෂ සාන්ද්‍රණය $0.01\ mol\ dm^{-3}$ වු ද, ජලීය ද්‍රාවණයක $25\ cm^3$ කට $AgNO_{3(aq)}$ ක්‍රමයෙන් එක් කරගෙන යයි.

a. පලමුව අවක්ෂේප වන්නේ $AgCl$ බව ගණනයක් ආධාරයෙන් පෙන්වන්න.

b. $Ag_2CrO_4$ අවක්ෂේප වන විට ද්‍රාවණයේ $Cl^-$ අයන සාන්ද්‍රණය කොපමණ ද?

c. $Ag_2CrO_4$ අවක්ෂේප වන විට සෑදී ඇති $AgCl$ ස්කන්ධය කොපමණ ද?

$AgCl$ හි ද්‍රාව්‍යතා ගුණිතය $1.6 \times 10^{-10}\ mol^2\ dm^{-6}$ $Ag_2CrO_4$ හි ද්‍රාව්‍යතා ගුණිතය $9 \times 10^{-12}\ mol^3\ dm^{-9}$

5. $HA$ දුබල අම්ලය ජලයේ හා $B$ කාබනික ස්ථරයේ ද්‍රාව්‍ය වන නමුත් කාබනික ද්‍රවයේදී සංඝට්ටනයට හෝ විඝටනයට භාජනය නොවේ. $B$ හා ජලය එකිනෙක අමිශ්‍ර වේ. $HA$ සාන්ද්‍රනය $0.05\ mol\ dm^{-3}$ වන ජලීය ද්‍රාවණයේ $100\ cm^3$ ක් හා $B$ ද්‍රවයෙහි $50\ cm^3$ ක් සමඟ හොඳින් සොලවා සමතුලිත වීමට ඉඩ හරින ලදී. මෙවිට ජලීය ස්ථරයේ $p^H$ අගය 4 වන බව සොයාගන්නා ලදී.
මෙම උෂ්ණත්වයේදී $K_{a(HA)} = 1 \times 10^{-7}\ mol\ dm^{-3}$ , $K_w = 1 \times 10^{-14}\ mol^2\ dm^{-6}$ නම්, පහත ඒවා ගණනය කරන්න.

a. ජලීය ස්ථරයේ $H^+$ අයන සාන්ද්‍රනය,

b. ජලීය ස්ථරයේ $HA$ සාන්ද්‍රනය,

c. $B$ ස්ථරයේ $HA$ සාන්ද්‍රනය,

d. ජලය හා $B$ අතර $HA$ හී විභාග සංගුණකය,

**e.** ජලයේ $HA$ හී විඝටන ප්‍රමාණය,

**6.** පරිමාව $5\ dm^3$ වූ දෘඪ බදුනක ඇති $C_{(s)} + CO_{2(g)} \rightleftharpoons 2\ CO_{(g)}$ සමතුලිතතාවය සලකන්න.
$227\ ℃$ උෂ්ණත්වයේදී $5\ dm^3$ දෘඪ බඳුන තුල $CO_2, 0.09\ mol$ පමණක් යොදා ආරම්භ කල විට ඉහත සමතුලිතයට එළැඹුනු පසු බඳුන තුල $CO_2, 0.04\ mol$ වේ.

**a.** සමතුලිතාවයේදී $CO$ හා $CO_2$ වල සාන්ද්‍රන ලබාගන්න.

**b.** ඉහත උෂ්ණත්වයේදී සමතුලිතය සඳහා $K_c$ හා $K_p$ ගණනය කරන්න.

**c.** $427\ ℃$ දී සමතුලිතයට එළැඹුනු පසු බඳුන තුල පීඩනය $2 \times 10^5\ Pa$ වේ. $427\ ℃$ දී සමතුලිතය සඳහා $K_p = 1.9 \times 10^5\ Pa$ නම් සමතුලිතාවයේදී $CO$ හා $CO_2$ වල ආංශික පීඩන ගණනය කරන්න.

**7.** $2\ AB_{(aq)} + 2\ C_{2(aq)} \rightarrow A_{2(aq)} + 2\ C_2B_{(g)}$ ප්‍රතික්‍රියාව සඳහා කල පහත පරීක්ෂණ තුන සලකන්න.

**(1)** පරීක්ෂණය $AB_{(aq)}$ හී සාන්ද්‍රනය $0.004\ mol\ dm^{-3}$ වන $500\ cm^3$ ක් හා $C_{2(aq)}$ හී සාන්ද්‍රනය $0.024\ mol\ dm^{-3}$ වන $500\ cm^3$ ක් මිශ්‍ර කල විට $10\ s$ කාලයකදී $C_2B_{(g)}, 0.4\ mol$ ක් ලැබුනි.

**a.** $C_2B_{(g)}$ හී සෑදීමේ සීඝ්‍රතාවය සොයන්න.

**b.** $A_{2(aq)}$ හී සෑදීමේ සීඝ්‍රතාවය සොයන්න.

**c.** $C_{2(aq)}$ හී වැයවීමේ සීඝ්‍රතාවය සොයන්න.

**(2)** පරීක්ෂණය $AB_{(aq)}$ හී සාන්ද්‍රනය $0.008\ mol\ dm^{-3}$ වන $500\ cm^3$ ක් හා $C_{2(aq)}$ හී සාන්ද්‍රනය $0.024\ mol\ dm^{-3}$ වන $500\ cm^3$ ක් මිශ්‍ර කල විට ප්‍රතික්‍රියා සීඝ්‍රතාවය $0.08\ mol\ dm^{-3} s^{-1}$ වේ.

**d.** $AB_{(aq)}$ ට සාපේක්ෂ ප්‍රතික්‍රියාවේ පෙළ සොයන්න.

**(3)** පරීක්ෂණයෙන් $C_{2(aq)}$ ට සාපේක්ෂ ප්‍රතික්‍රියාවේ පෙළ 1 බව සොයාගන්නා ලදී.

**e.** ප්‍රතික්‍රියාව සඳහා සීඝ්‍රතා ප්‍රකාශණය ලියන්න.

**f.** $AB_{(aq)}$ හී සාන්ද්‍රනය $0.024\ mol\ dm^{-3}$ වන $500\ cm^3$ ක් හා $C_{2(aq)}$ හී සාන්ද්‍රනය $0.004\ mol\ dm^{-3}$ වන $500\ cm^3$ ක් මිශ්‍ර කල විට ප්‍රතික්‍රියා සීඝ්‍රතාවය සොයන්න.

**g.** ඉහත සම්පූර්ණ ප්‍රතික්‍රියාව තාප දායක නම්, ප්‍රතික්‍රියාවේ විභව ශක්ති පැතිකඩේ දල සටහනක් අඳින්න.

**8.** $HA$ දුබල අම්ලය ජලයේ හා $B$ කාබනික ස්ථරයේ ද්‍රාව්‍ය වන නමුත් කාබනික ද්‍රවයේදී සංඝට්ටනයට හෝ විඝටනයට භාජනය නොවේ. $B$ හා ජලය එකිනෙක අමිශ්‍ර වේ. $HA$ සාන්ද්‍රනය $0.087\ mol\ dm^{-3}$ වන $B$ ද්‍රවයෙහි $500\ cm^3$ ක් හා ජලය $500\ cm^3$ ක් සමඟ හොඳින් සොලවා සමතුලිත වීමට ඉඩ හරින ලදී. මෙවිට ජලීය ස්ථරයේ $p^H$ අගය 3.5 වන බව සොයාගන්නා ලදී.
මෙම උෂ්ණත්වයේදී $K_{a(HA)} = 8 \times 10^{-6}\ mol\ dm^{-3}$ , $K_w = 1 \times 10^{-14}\ mol^2\ dm^{-6}$ නම්, පහත ඒවා ගණනය කරන්න.

**a.** මෙම උෂ්ණත්වයේදී ජලය හා $B$ අතර $HA$ හී විභාග සංගුණකය සොයන්න.

**b.** තවත් පරීක්ෂණයකදී $HA$ සාන්ද්‍රනය $0.087\ mol\ dm^{-3}$ වන $B$ ද්‍රවයෙහි $500\ cm^3$ ක් හා $0.037\ mol\ dm^{-3}$ ජලීය $NaOH$, $500\ cm^3$ ක් සමඟ හොඳින් සොලවා සමතුලිත වීමට ඉඩ හරින ලදී. මෙවිට ජලීය ස්ථරයේ $p^H$ අගය සොයන්න.

**9.** $27\ ℃$ දී $Mg(OH)_2$ වල ද්‍රවHතා ගුණිතය $1.2 \times 10^{-11}\ mol^3 dm^{-9}$ හා $NH_3$ වල විඝටන නියතය $1.8 \times 10^{-5}\ mol\ dm^{-3}$ වේ.

**a.** $27\ ℃$ දී $Mg(OH)_2$ වලින් සංතෘප්ත ජලීය ද්‍රාවණයක $p^H$ අගය සොයන්න.

**b.** $MgSO_4$ ද්‍රාවණයක $[Mg^{2+}] = 1 \times 10^{-10}\ mol\ dm^{-3}$ ට වඩා අඩු වීමට ද්‍රාවණයේ පැවතිය යුතු අවම $OH^-$ සාන්ද්‍රනය සොයන්න.

**c.** $MgSO_4$ ද්‍රාවණය $100\ cm^3$ ක ඉහත $OH^-$ සාන්ද්‍රනය පවත්වා ගැනීමට $27\ ℃$ දී හා $1\ atm$ හිදී කොපමණ $NH_3$ පරිමාවක් ද්‍රාවණයේ දියකල යුතුවේද? $NH_3$ පරිපූර්ණ වායුවක් බව උපකල්පනය කරන්න.

**d.** $0.5\ moldm^{-3}$ ජලීය $NH_3$ ද්‍රාවණයක $50\ cm^3$ කට $0.2\ moldm^{-3}$, $MgSO_4$ ද්‍රාවණයකින් $50\ cm^3$ ක් එක් කල හොත් $Mg(OH)_2$ අවක්ෂේප වන බව පෙන්වන්න.

**e.** $Mg(OH)_2$ අවක්ෂේප වීම වැලැක්වීමට ද්‍රාවණයට එක් කල යුතු $NH_4Cl$ ස්කන්ධය සොයන්න.
$(N = 14, \quad O = 16, \quad Cl = 35.5)$

**10.** රේචනය කරන ලද බඳුනකට සංශුද්ධ $PCl_5$ යම් ස්කන්ධයක් ඇතුළු කර සමතුලිත වීමට ඉඩ හැරිය විට 250 ℃ දී පහත සමතුලිතතාවය ඇති කරයි.

$$PCl_{5(g)} \rightleftharpoons PCl_{3(g)} + Cl_{2(g)}$$

මෙවිට පද්ධතියේ පීඩනය $2 \times 10^4 Pa$ වූ අතර මිශ්‍රණයේ පරිමාව අනුව 40% ක් $Cl_{2(g)}$ පවතී. 250 ℃ දී

**a.** සමතුලිතතාවයේදී එක් එක් සංඝටකයේ ආංශික පීඩනය සොයන්න.

**b.** සමතුලිතතාවයේ $K_p$ අගය සොයන්න.

250℃ නියත උෂ්ණත්වයේදී වායු මිශ්‍රණයේ පීඩනය $0.2 \times 10^5 Pa$ වන තුරු පරිමාව වැඩි කලහොත්,

**c.** නව සමතුලිතතාවයේදී $PCl_5$ වියෝජන ප්‍රතිශතය සොයන්න.

**d.** එක් එක් සංඝටකයේ නව සමතුලිත ආංශික පීඩන සොයන්න.

**e.** නව සමතුලිතතාවයේ $K_p$ අගය සොයන්න.

**11.** සංශුද්ධ ජලයේ විඝටනය සඳහා ප්‍රකාශනය ලියා විඝටන නියතය, $K_w$ සඳහා ප්‍රකාශනය ද ලියන්න.

**a.** $298\,K$ දී $K_w = 1 \times 10^{-14}\,mol^2dm^{-6}$ වේ. මෙම උෂ්ණත්වයේදී සංශුද්ධ ජලයේ $p^H$ අගය 7 බව පෙන්වන්න.

**b.** සංශුද්ධ ජලයේ 990 $cm^3$ කට 0.1 $mol\,dm^{-3}$, $HCl$ ද්‍රාවණයකින් 10 $cm^3$ ක් එක් කල විට අවසාන $p^H$ අගය සොයන්න.

**c.** ජලීය ද්‍රාවණයක $CH_3COOH$ ට සාපේක්ෂ සාන්ද්‍රණය 0.01 $mol\,dm^{-3}$ වන අතර $CH_3COONa$ ට සාපේක්ෂ සාන්ද්‍රණය 0.02 $mol\,dm^{-3}$ වේ. ඉහත ජලීය ද්‍රාවණයේ $p^H$ අගය සොයන්න.
$298\,K$ දී හී $K_a = 1.78 \times 10^{-5}\,mol\,dm^{-3}$ වේ.

**d.** ඉහත **c** හී ද්‍රාවණයේ 990 $cm^3$ කට 0.1 $mol\,dm^{-3}$, $HCl$ ද්‍රාවණයකින් 10 $cm^3$ ක් එක් කල විට අවසාන $p^H$ අගය සොයන්න.

**e.** ඉහත **d** හී $p^H$ වෙනස, **b** හී $p^H$ වෙනසට වඩා කුඩා වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

**12.** එක්තරා $I_2$ ප්‍රමාණයක් අඩංගු $CS_2$, 500 $cm^3$ ක් හා සාන්ද්‍රණය 0.1 $mol\,dm^{-3}$ වන $KI$ ද්‍රාවණයක් සමග සොලවා සෑහෙන වේලාවක් තිබෙන්නට හරින ලදී. ඉන් පසු $Na_2S_2O_3$ ද්‍රාවණයක් සමග එක් එක් ස්ථරය අනුමාපනය කිරීමෙන් එම ස්ථර වල දියවී ඇති $I_2$ ප්‍රමාණ නිර්ණය කරන ලදී. එහිදී $CS_2$ ස්ථරයේ $I_2$, 0.04 $mol$ ඇති බව සොයා ගන්නා ලදී. $CS_2$ හා ජලය අතර $I_2$ හි විභාග සංගුණකය 80 ක් හා $I_2 + I^- \rightleftharpoons I_3^-$ යන ප්‍රතික්‍රියාව සඳහා මෙම පරීක්ෂණය සිදු කරන උෂ්ණත්වයේදී සමතුලිතා නියතය $K_c = 20\,mol^{-1}dm^3$ ලෙස ගෙන පහත ඒවා ගණනය කරන්න.

**a.** ජලය ස්ථරයේ ඇති නිදහස් $I_2$ සාන්ද්‍රණය

**b.** ජල ස්ථරයේ ඇති $I_3^-$ සාන්ද්‍රනය

**13.** −23℃ දී පරිමාව 2.00 $dm^3$ වන දෘඩ බඳුනක් තුල $X_{(g)}$ නම් වායුව $2.5 \times 10^5\,Nm^{-2}$ පීඩනයක් යටතේ පවති. 5℃ ට ඉහල උෂ්ණත්ව වලදි පද්ධතිය පහත සමතුලිතතාවයට පත්වේග

$$X_{(g)} \rightleftharpoons Y_{(g)} + 2\,Z_{(g)}$$

27℃ ට රත් කළ විට පද්ධතිය සමතුලිතතාවයට පැමිණි අතර මුලු පීඩනය $6 \times 10^5\,Nm^{-2}$ විය.

**a.** 27℃ දි එක් එක් වායුවේ මවුල ප්‍රමාණල

**b.** 27℃ දි එක් එක් වායුවේ ආංශික පීඩනල

**c.** 27℃ දි $K_p$ ගණනය කරන්නග

මෙම උෂ්ණත්වයේදි පද්ධතියෙන් $X_{(g)}$ මවුල 0.08 $mol$ ඉවත්කර නැවත සමතුලිත විමට ඉඩ හරින ලදි. එවිට පද්ධතියේ මුලු පීඩනය $4.5 \times 10^5\,Nm^{-2}$ වියග

**d.** නව සමතුලිත අවස්ථාවේදි එක් එක් වායුවේ මවුල ප්‍රමාණ හා එක් එක් වායුවේ ආංශික පීඩන ගණනය කරන්නග

**e.** $X_{(g)}$ යම් ප්‍රමාණයක් ඉවත් කළ විට එය පද්ධතියට කෙසේ බලපා ඇත්දැයි විස්තර කරන්නග


Chemistry